# මී පැංචා ගේ ඇබැද්දිය



තෙනුලි සහේලි හේරත්

මී පැංචා ගේ ඇබැද්දිය

තෙනුලි සඟේලී හේරත්

කෘතිය පළ කරන දිනය : 2023 නොවැම්බර් 15

ISBN අංකය : ISBN 978-624-208-034-5

# පිදුම

ආදරණීය මහාමායා විදුහල් මෑණියන් ට

# ස්තූතිය

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ මහාමායා බාලිකා විද්‍යාලයට

එම ව්‍යාපෘතිය මෙහෙයවූ මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමියට

ව්‍යාපෘතියේ නිර්මාතෘ සෙනෙවිරත්න මහලේකම් ගුරු පියාණන් ට

මාගේ ආදරණීය ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මෑණියන් ට

ලිවීමට මා හුරු කළ කිරි අම්මාට

මාගේ ආදරණීය දෙමව්පියන්ට

වෙනුති අක්කාට සහ තෙනුජ මල්ලීට

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට පිවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

එකෝමත් එක කාලෙක පුංචි මී පවුලක් හිටියා.

ඒ මී පවුලේ පුංචි මී පැටවු තුන් දෙනෙකුත් හිටියා.

ඒ මී පැටවු තුන්දෙනා වුටූ, මිකී සහ ඩොනල්ඩ්.



ඔන්න එක දවසක් මී අම්මයි

මී තාත්තයි කෑම හොයන්න


ගියා.

අම්මා කියලා ගියේ ලාම්පුව

නිවන්න එපා කියලයි.

අපි එනකම් එලියට යන්නත්

එපා කියලා අම්මා කිව්වා .



හැබැයි වුටූ ටිකක් චණ්ඩියි !

එළිය දිහා බලාගෙන හිටපු වුටූ ට

හිතුණා   ලාම්පු එළියට වඩා

හඳ එළිය හොඳයි කියලා.

ඉතින්  වුටූ ලාම්පුව නිමුවා.

ගෙදරට හදෙන් කෑල්ලක්

ගේන්නම් කියලා හිතාගෙන

එළියට ගියා.

ටුටූ මේස පුටු ගෙනැත් තියලා හදෙන් කැල්ලක් කඩා ගන්න බැලුවා.

හැබැයි ටුටූ ට ඒ වැඩේ කරන්න බැරි වුණා.

හඳට තාම උස මදි.



ටුටූ වට පිට බලලා සාලයේ මුල්ලක තිබුණු කොට්ටයක් අමාරුවෙන් අරගෙන ආවා.

ඒක පුටුව උඩ තිබ්බා.

ඊට පස්සේ ඒක උඩට නැග්ගා.



එතකොටම ඝඩාව් හඬක්
නංවමින් කොට්ටය පෙරළුණා.

බලද්දි එයා නැගලා හිටියේ
පූසාගෙ පිට උඩ.

පුළුන් කොට්ටයක් කියලා
හිතාගෙන වුටූ ගෙනත්
තියෙන්නේ නින්ද ගිහින් හිටපු
පූස් රාළ ...!

හොඳටම බයවුණු වුවූ එයාගේ

දකුණු අත පැත්තේ තියෙන

ගහ උඩට නැගලා හැංගුණා.

හොඳටම තරහ ගිය පූස් රාළ

වුවූ ව හැම තැනම හෙව්වා.

වුවූ බයෙන් වෙව්ලමින් ගහ

උඩට වෙලා හිටියා.

"චූටි ඔයා  මොකද මෙතන කරන්නේ?"

පුරුදු කටහඬක් ඇහුණා.

බලනකොට චූටිගෙ අම්මයි

තාත්තයි කෑම හොයා ගෙන

ආපහු ඇවිත්.

" මගේ සෙල්ලම් බඩුවක් හොය හොයා  හිටියේ".

චූටි ගොත ගහන්න පටන් ගත්තා.



ගෙදර ගියා ට පස්සේ අම්මා

ඇහුවා ලාම්පුව නිමුවේ කවුද

කියලා.

ටුටූ අඬන්න පටන් ගත්තා .

මට සමා වෙන්න අම්මේ ! මම

ඇත්තම කියන්නම්.

ටුටූ එයා ට වුණු හැමදේම

කිව්වා.

දෙමව්පියන් කියන දේ

පිළිපදින්න ඕනෑ.එයාලට

බොරු කියන්නත් හොඳ නෑ.

අම්මයි තාත්තයි චූටූ ට අවවාද කරා.

ඊට පස්සෙ කවදාවත් චූටූ ඒ

වගේ වැරදි වැඩ කළේ නෑ.

දෙමව්පියන්ට  බොරු කිව්වෙත්

නෑ.





පසුවදන

නුතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නුතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20